කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

නිවේදන අංකය : **01** WW/T/20/12/31/01
වර්ණය : ඇම්බර්

# ප්‍රබල අකුණු පිළිබඳව අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින්
2020 දෙසැම්බර් මස 31 වන දින රාත්‍රි 11.00 වන තෙක් වලංගු වන පරිදි
2020 දෙසැම්බර් මස 31 වන දින ප.ව. 03.00 ට නිකුත් කරන ලදී.

## සබරගමුව, මධ්‍යම සහ බස්නාහිර පළාත් සහ ගාල්ල, මාතර, මඩකළපුව, අම්පාර සහ බදුල්ල දිස්ත්‍රික්ක සඳහා

## විමසිලිමත් වන්න !

සබරගමුව, මධ්‍යම සහ බස්නාහිර පළාත් වලත් ගාල්ල, මාතර, මඩකළපුව, අම්පාර සහ බදුල්ල දිස්ත්‍රික්ක වලත් තැනින් තැන ගිගුරුම් සහිත වැසි සමග ප්‍රබල අකුණු ඇතිවීමේ වැඩි හැකියාවක් පවතී. ඇතැම් ස්ථාන වලට මි.මී. **100** වැඩි තද වර්ෂාපතනයන් ඇති විය හැක.




ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මඟින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

## ආරක්ෂිත පියවර:

අකුණු සහ ගිගුරුම් පවතින අවස්ථාවල පහත ආරක්ෂිත පියවරයන් අනුගමනය කරන මෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මහජනතාවට අවවාද කෙරේ.

- එළිමහනේ හෝ ගස් යට නොසිටිය යුතු අතර ආරක්ෂිත ගොඩනැගිල්ලක් හෝ සංවෘත වාහනයක් තුළ රැඳී සිටින්න.
- කුඹුරු, තේ වතු, ක්‍රීඩා පිටි මෙන්ම ජලාශ වැනි විවෘත ස්ථාන වල රැඳී සිටීමෙන් වලකින්න.
- රැහැන් සහිත දුරකථන සහ විදුලියට සම්බන්ධ කරන ලද විදුලි උපකරණ භාවිතයෙන් වලකින්න.
- බයිසිකල්, ට්‍රැක්ටර් සහ බෝට්ටු වැනි විවෘත වාහන භාවිතයෙන් වලකින්න.
- තද සුළං හේතුවෙන් ගස් හා විදුලි රැහැන් බිම ඇද වැටීමට ඉඩ ඇති බැවින් ඒ පිළිබඳව සැලකිලිමත් වන්න.
- හදිසි තත්වයකදී ප්‍රාදේශීය ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන නිලධාරීන් ගේ සහය පතන්න.

| වර්ණය: -රතු<br>අනතුරු ඇඟවීම (පියවර ගන්න) | වර්ණය: -ඇම්බර්<br>අවවාදාත්මක (සූදානම් වන්න) | වර්ණය: -කොළ<br>(බලපෑමක් නැත) |
| --- | --- | --- |

Spatial rainfall distribution: Isolated: <25%, A few: 26-50%, Many: 51-75%, Most: 76-100%
Rainfall amount (mm): Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.